**කන්තලේ ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**
**----------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
**--------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 15දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 15 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කන්තලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------**

| | ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සේවක ඇප රු.83,000 ක්ශේෂ පත්‍රය මඟින් හෙළිදරව් නොකර හිලව් කර දක්වා තිබුණි. | ගිණුම් මඟින් හෙළිදරව් කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුම් ප්‍රකාශයට ඇතුලත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දැනුම් දෙමි. |
| (ii) | වරෙන්තු ගාස්තු හා දඩ යටතේ 2017 මාර්තු සිට 2018 නොවැම්බර් දක්වා කාලයට ලද රු.12,608,287 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් ප්‍රකාශයෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (iii) | ලංකා බැංකු ගිණුම් අංක 4940252 දරන බැංකු ගිණුමඅදාළ මුදල් පොත සංශේධනය කර ආදායම් වියදම් ගිණුම්ගත නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ලැබීම් රු.2,365,000 ක්ද ගෙවීම් රු.50,000 ක් හා බැංකු ගාස්තු රු.450 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සංශෝධිත මුදල් පොතට ගැලපීම් කර වසරට අදාළ ආදායම් වියදම් ගිණුම්ගත කළ යුතුවේ. | බැංකු වාර්තා අප වෙත ලැබෙන්නේ අදාළ මාසය ඉක්මවූ පසුවයි. එම නිසා ඍජු ප්‍රේෂණ හඳුනා ගැනීමට හැකිවූයේ 2020.01.08 වන දිනයි. ඒ අනුව අදාළ ඍජු ප්‍රේෂණ බැංකු මුදල් පොතේ ශේෂයට ගණනය කිරීමට හැකියාවක් නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2015 වර්ෂයට අදාළව ලැබී තිබූ මුද්දර ගාස්තු රු.596,959 ක් හිඟ මුද්දර ගාස්තු ගිණුමට හර කර මුද්දර ගාස්තු ලැබීම් ගිණුමට බැර කර තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුමට ගැලපිය යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් ප්‍රකාශයෙන් නිවැරදි කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (v) | පූර්ව වර්ෂවලට අදාළව ලැබුණු වරිපනම් බදු රු.769,161 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගත යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් ප්‍රකාශයෙන් නිවැරදි කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

(ආ) **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| ගිණුම්කරණ අඩුපාඩුව | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව 240,473,768 ක් වූ විෂයයන් 09 ක් සඳහා විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ලේඛන නිසි පරිදි වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුවේ. | පසුගිය වසර කිහිපය තුළ සුදුසුකම්ලත් ලේකම්වරයෙකු පත්කර නොසිටි බැවින්, අවසාන ගිණුම් හා නඩත්තු කළ යුතු ලේඛන පිළිබඳ නිසි පරිදි කටයුතු කර නොමැත. එම නිසා ආරම්භක ශේෂයේ සවිස්තරාත්මක තොරතුරු කාර්යාල ලේඛනවලින් සොයා ගැනීම අපහසු වී ඇත. |

1.4 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත** | | | |
| (i)24 වගන්තිය | මාර්ග ඉන්වෙන්ට්‍රිගත කිරීමට හා ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා මාර්ග ඉන්වෙන්ට්‍රියක් සකස් කර ඇති අතර, පළාත් පාලන කොමසාරිස්තුමාගේ උපදෙස් මත එම මාර්ග GPRS තාක්ෂණය යොදා ගනිමින් නැවත සකස් කරමින් පවතී. ගැසට් කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii)159 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු රු.30,624,949 ක හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ආදායම් අප්‍රමාදව අයකළ යුතුවේ. | සාකච්ඡා කර ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |

(ආ) **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතී**

| | | | |
|---|---|---|---|
| (i) 33 වැනි රීතිය | වරිපනම් බදු පැහැර හරින පුද්ගලයන් පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. | රීතී ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වරිපනම් බදු පැහැර හරින පුද්ගලයින් සඳහා ලැයිස්තුවක් නඩත්තු කිරීමට කටයුතු සිදු කරගෙන යනු ලබයි. |
| (ii) 218වැනි රීතිය | සියලුම ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් සමීක්ෂණය කර නොතිබුණි. | රීතී ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අයිතිය තහවුරු කර ගැනීම සඳහා කටයුතු කෙරෙමින් පවතී. නිවැරදි තොරතුරු ලද පසු එකී සමීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරනු ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019දෙසැම්බර් 31 දිනෙන් අවසන්වර්ෂය සඳහා සභාවේපුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.10,508,619 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූවියදමරු.2,547,663 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 2,217 | 2,217 | 1,531 | 9,695 | 2,288 | 2,323 | 2,223 | 9,009 |
| කුලී | 6,170 | 6,170 | 2,955 | 4,989 | 16,650 | 4,913 | 3,159 | 1,774 |
| වෙනත් ආදායම් | 4,500 | 4,500 | 11,659 | 11,660 | 2,725 | 2,725 | 1,266 | 11,810 |
| | 12,887 | 12,887 | 16,145 | 26,344 | 21,663 | 9,961 | 6,648 | 22,593 |

**2.2.2 වරිපනම් හා බදු**

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වරිපනම් බදු අයවීමආරම්භක හිඟයෙන් හා බිල්කිරීම්වලින් සියයට 13.6 ක් තරම් අවම මට්ටමක පැවතුණි.තවද දීර්ඝ කාලයක සිට පැවත එන හිඟ අයකර ගැනීමට සාර්ථක වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | වරිපනම් හිඟ අප්‍රමාදව අයකර ගත යුතුවේ. | වරෙන්තු නිකුත් කර වාරික වශයෙන් හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු සිදුකර ඇත. |

**2.2.3 මුද්දර ගාස්තු**

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මුද්දර ගාස්තු හා උසාවි දඩ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට පිළිවෙලින් රු.6,733,171 ක් හා රු.4,926,635 ක් අයවීමට තිබුණි. | හිඟ මුද්දර ගාස්තු හා උසාවි දඩ අප්‍රමාදව අයකර ගත යුතුවේ. | අදාළ මුදල් ලබා ගැනීම සඳහා පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට තොරතුරු ඉදිරිපත් කර ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------------

**3.1 කාර්යයසාධනය**

----------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුබසාධනය යන කාර්යයන් සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 11 කට අදාළව 2013 වර්ෂයේ දී සකස් කර තිබූ අතුරු ව්‍යවස්ථා අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා අනුමත කරවා ගත යුතුවේ. | 2019 වර්ෂයේදී අතුරු ව්‍යවස්ථා 09 ක් සකස් කර ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.<br>අනුමැතිය ලැබුණු පසු ඉතිරි අතුරු ව්‍යවස්ථා සකස් කර අනුමැතියට ඉදිරිපත් කරමි. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත්ව සිදුකර නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ පවතින ගැටළු කඩිනමින් නිරාකරණය කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

**(ඇ) පාරිසරික බලපත්‍ර**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් නොවීය. | වාර්ෂික සමීක්ෂණයක් සිදු කර පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යවසායන් හඳුනාගත යුතුවේ. | එම බලපත්‍ර අවලංගු වීමට මාස 02 කට පෙර සිහිකැඳවීම් ලිපි යැවීමට කටයුතු කරනු ලැබේ.<br>2014 බලපත්‍ර ලබා 2017 වන විට අලුත් නොකළ ව්‍යාපාර පිළිබඳ සොයා බලා දැන්වීමට ආදායම් පරීක්ෂකට දන්වා ඇති බව දන්වා සිටිමි. |

**(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ ඇතුළත් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා අදාළ නිර්ණායක සමාලෝචිත වර්ෂයේ දී හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක/ අරමුණු හඳුනාගෙන වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුවේ. | 2019 වර්ෂයේ දී සභාව මඟින් තිරසාර සංවර්ධන අරමුණු වලට අදාළ කාර්යයන් රැසක් ඉටු කර ඇත. තිරසාර සංවර්ධන ඉලක්ක ලඟා කිරීම යන මැයෙන් වෙනමම වැඩසටහනක් ආකාරයෙන් නිශ්චිතව වෙන් කිරීමක් කර ඒ අරමුණ/ඉලක්ක සපුරාලීම සඳහා වූ ගොනු පවත්වා ගැනීමක් හෝ එම අරමුණු සපුරා ගැනීමේ සැලැස්මක් පමණක් සකස් කර නොමැති බව දැනුම් දෙමි. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දුරකථන කුළුණු 07කින් ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක නොවුන බැවින් අය කර ගැනීමට ඇති සේවා ගාස්තු අය කර ගැනීමට නොහැකි විය.2020.06.23 දින සභාවට වාර්ෂිකව රු.20,000 ක සේවා ගාස්තුවක් අය කර ගැනීමට යෝජනා ඉදිරිපත් කර ඇත. |
| (ආ) ද්‍රව්‍ය ආධාර ලබාදීමේදී පුද්ගලයන්ගේ ආදායම් තත්ත්වය පිළිබඳ ග්‍රාමනිලධාරීවරයාගේ නිර්දේශය සමඟ ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොගෙන ද්‍රව්‍ය ආධාර ලබාදී තිබුණි. | සුදුසුකම් පරික්ෂා කර ද්‍රව්‍ය ආධාර ලබා ගත යුතුවේ. | අදාළ කොට්ඨාසය නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරයාගේ ඉල්ලීම හා නිර්දේශය මත මෙම ආධාර ලබාදී ඇත. |

**3.3** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දින වන විට බස් නැවතුම්පොළ කඩකාමරවල හිඟ කුලී ආදායම රු.1,007,890ක් හා පොදු වෙළඳපොළ කඩකාමරවල හිඟ කුලී ආදායම රු.2,999,280 ක් විය. මෙහි වසා දැමූ කඩ කාමර සම්බන්ධයෙන් 2018 සැප්තැම්බර් මාසයේදී සම්මත කල සභා තීරණයක් ක්‍රියාත්මක කිරීමේදී සභාවට අවාසි සහගත ලෙස කටයුතු කිරීම හේතුවෙන් වාර්ෂිකව රු.මිලියන 2 කට වැඩි ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | සභාවට වාසි සහගත ලෙස හිඟ කුලී අයකර ගැනීමට ක්‍රමවේදයක් සකසා ගත යුතුවේ. | මෙම කඩ කාමර බදු දීම 2017 වර්ෂයේ දී සිදුකර ඇති අතර සභාව ස්ථාපිත කරන විට වසරකට වැඩි කාලයක් ගතවී තිබුණි. ඒ වන විටත් ව්‍යාපාර කටයුතු අඩපණ වී බොහෝ කඩ කාමර වසා දමා තිබුණි. බදු දී තිබූ කාලය වසර 03 කටය. කන්තලේ පොදු වෙළඳපොළ ආකර්ශනීය වෙළඳ ස්ථානයක් බවට පත් කිරීමේ අරමුණින් සභාව විසින් ගනු ලැබූ ඒකමතික තීරණයක් අනුව වසා තිබූ කඩ කාමර රු.5000 කට ලබාදීමට තීරණය කළ අතර දෙවන ටෙන්ඩර් කරුවන් ඉල්ලූ සෑම අවස්ථාවකදීම වසා තිබූ කඩ කාමර ලබාදුන් බව පෙන්වා දෙන්නට කැමැත්තෙමි. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සංවර්ධන නිලධාරි, ආදායම් පරීක්ෂක, යාන්ත්‍රිකක්‍රියාකරු, වැඩ පරීක්ෂක හා උපකරණ ක්‍රියාකරන්නන් යන තනතුරුවල පුරප්පාඩු පැවතුණි. | පුප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතුවේ. | මාසික කාර්යය මණ්ඩල වාර්තාව යවා ඇත.මේ සම්බන්ධයෙන් අදාළ පත්වීම් බලධාරියා මේවනතුරුත් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. |
| (ආ) | අනුමත තනතුරු 07 ක් සඳහා අතිරික්ත 33ක්පැවතුණි. | අතිරික්ත විධිමත් කර ගත යුතු වේ. | අතිරික්ත සේවකයින් බඳවා නොගැනීමට කටයුතු කරන බවදන්වමි. |
| (ඇ) | සේවය හැර ගිය හා සේවයෙන් ඉවත් කළ සේවකයන් අට දෙදෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු.1,458,314 ක් විය. | අයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | එක් සේවකයකු මූල්‍ය වංචාවකට භාජනය වී බන්ධනාගාර ගතකර ඇති බැවින් එම මුදල් අයකර ගැනීමට නොහැකිය.තවත් අයෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්වීමෙන් පසු සේවයට වාර්තා කර නොමැත. නීත්‍යානුකූල කටයුතු කිරීම සඳහා වියදම අයවිය යුතු ශේෂයට වඩා ඉහල බැවින් සභා තීරණයක් ගෙන බොල් ණය ලෙස කපාහරින බව දන්වමි. සේවයෙන් විශ්‍රාම ගොස් ඇති නිලධාරියාගේ මුදල ලබා ගැනීම සඳහා අදාල ආයතන වෙත ලිපියොමු කර ඇත.දැනට කලාප අධ්‍යාපන කාර්යාලයේ සේවය කරන නිලධාරියෙකුගෙන් අයවිය යුතු මුදල අයකර ගැනීම සඳහා එම කාර්යාලය වෙත දන්වා යවා ඇත. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 ඌන උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාහන 03 ක් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්යව පරිශ්‍රයේ රඳවා තිබුණි. | ඌන උපයෝජිත වත්කම් පූර්ණ උපයෝජනයක් කළ යුතුවේ. | අලුත්වැඩියා කොට භාවිතයට ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | කාර් රථයක් අවුරුදු 11 කට අධික කාලයක සිට විනාශ වීමට ඉඩහැර තිබූ අතර ට්‍රැක්ටර් ට්‍රේලර් 02 ක් වසර 05 කාලයක සිට විනාශ වීමට ඉඩහැර තිබුණි. | හැකිතාක් ඉක්මනින් වෙන්දේසි කළ යුතුවේ. | ප්‍රධාන ලේකම් ඉංජිනේරු කාර්යාලය වෙත ගර්හිත වාහන වෙන්දේසි කරන ලෙස ලිඛිතව දන්වා ඇත. |

### 3.5.2 වාහන පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව පරිහරණය කරන වාහන 03 ක් පවරා ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | පවරා ගත හැකි වාහන පවරා ගත යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

## 3.6 ප්‍රසම්පාදනය

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නිශ්චිත විස්තර හා වටිනාකම් නොදක්වා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණි. | විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුවේ. | පෙන්වා ඇති අඩුපාඩු සම්පූර්ණ කර ප්‍රසම්පාදන වාර්තාව 2020 දී සකස් කර ඇති බව දන්වා සිටිමි. |
| (ආ) | භාණ්ඩ මිලට ගැනීම සඳහා මිලකැඳවීම් නිලධාරීන් හරහා සිදුකරනවා වෙනුවට මන්ත්‍රීවරයන් විසින් ලබාගත් මිල ගණන් විෂය ලිපිකරුට ලබා දී එම මිල ගණන් මත රු.8,709,955 ක් වටිනා භාණ්ඩ සහ සේවාවන් සපයා ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුවේ. | සභාවේ ගරු සභාපතිතුමාගේ උපදෙස් අනුව නිළධාරින් විසින් ප්‍රසම්පාදන කටයුතු සිදුකර ඇති අතර මන්ත්‍රීවරු ඍජුව ඒ සඳහා සහභාගි වී නොමැති බව දන්වමි. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා තිබුණද ඒ සඳහා විගණන නිලධාරීන් හා සභාපතිවරයා සහභාගී කරවා ගෙන නොතිබුණි. | ආයතන ප්‍රධානියාගේ අනිවාර්ය සහභාගීත්වය සහිතව කමිටු රැස්වීම් පැවැත්විය යුතුය. | 2019 වසරට අදාලව අභ්‍යන්තර විගණන කමිටු 04 ක් පවත්වා ඇති අතර 2020 වසරේ සිට නියමිත පරිදි සහභාගි වී අදාළ කමිටු පැවැත්වීමට කටයුතු කරන බව දන්වමි. |